ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
අධ්‍යාපන පීඨය
විශේෂ අවශ්‍යතා අධ්‍යාපනය පිළිබඳ අධ්‍යාපනවේදී
ගෞරව උපාධි වැඩසටහන
**6 වන මට්ටම 2023/2024**
අවසාන පරීක්ෂණය - **2024**
**SNU6225/ESU4125** - පුනරුත්ථාපනය හා ප්‍රජා මූලික පුනරුත්ථාපනය
කාලය පැය තුනයි. **(03)**

---

දිනය - **2025.03.08** වේලාව - පෙ.ව.09.30 - ප.ව.12.30 දක්වා

---

01 වන කොටසේ සියලුම ප්‍රශ්නවලට ද, 02 වන කොටසේ ඕනෑම ප්‍රශ්න තුනකට (03) ද පිළිතුරු සපයන්න.

## <u>01 - වන කොටස</u>

01. දෛනික ජීවිතයෙන් උදාහරණයක් **(01)** දක්වමින් පුනරුත්ථාපනය පිළිබඳ නිර්වචනයක් ලියා දක්වන්න.

02. දුබලතාවය පිළිබඳ සංකල්පය ඔබේ වචනවලින් පැහැදිලි කර උදාහරණ දෙකක් **(02)** සපයන්න.

03. දුබලතා සහිත පුද්ගලයින් සවිබල ගැන්වීමේ ක්‍රියාවලිය තුළදී සමාජ සචලතාව කෙටියෙන් පැහැදිලි කරන්න.

04. උදාහරණ තුනක් **(03)** ගෙනහැර දක්වමින් පුද්ගලයන් දුබලතාවයට පත්වියහැකි ආකාරය පැහැදිලි කරන්න.

05. පාසල්වල සහ සමාජය තුළ දුබලතාවයේ සීමා තුනක් **(03)** නම් කරන්න.

06. එක්සත් ජාතීන්ගේ සංවිධානයට අනුව ප්‍රජා මූලික පුනරුත්ථාපනය (CBR) නිර්වචනය කර ඇති ආකාරය සඳහන් කරන්න.

07. ශ්‍රී ලංකාවේ දුබලතා සහිත දරුවන්ට බලපාන නීති පහක් **(05)** ලැයිස්තුගත කරන්න.

08. ‘උත්ථාපනය’ යන යෙදුම කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 05x08=40)

## 02 - කොටස

09. (i.) දුබලතාවය පිළිබඳ ප්‍රධාන ආකෘති දෙක පැහැදිලි කරන්න. (ලකුණු 05)

(ii.) දුබලතාවයතුළදී නිරීක්ෂණය කරන ලද ලක්ෂණ පහක් **(05)** භාවිතා කරමින්, දුබලතාවය පිළිබඳ වෛද්‍ය ආකෘතිය සහ සමාජ ආකෘතිය අතර ඇති ප්‍රධාන වෙනස්කම් සාකච්ඡා කරන්න. (ලකුණු 08)

(iii.) දුබලතාවය සහිත පුද්ගලයන්ට වඩා හොඳින් උපකාර කිරීම සඳහා සමාජ ආකෘතිය තුළින්, සමාජ වෙනස්කම් දිරිමත් කළහැකි ආකාරය අගයන්න. මෙහිදී දුබලතා සහිත පුද්ගලයන් සඳහා දුබලතා අවම කිරීමට සමාජය ප්‍රතිව්‍යුහගත කළ හැකි ආකාරය පිළිබඳ උදාහරණ පහක් **(05)** සපයන්න. (ලකුණු 08)

10. (i.) විශේෂ අවශ්‍යතා සහිත දරුවන් පුනරුත්ථාපනය සිදු කිරීමේදී පවුල, පාසල සහ ප්‍රජාවේ කාර්යභාරය සාකච්ඡා කරන්න. පුනරුත්ථාපන ක්‍රියාවලියේදී ඉහත එක් එක් කණ්ඩායම සඳහා ලබාදිය හැකි ප්‍රධාන වගකීම් අවම වශයෙන් පහක් **(05)** සඳහන් කරන්න. (ලකුණු 05)

(ii.) "දුබලතා සහිත පුද්ගලයින් සඳහා ප්‍රජා මූලික පුනරුත්ථාපනයේ සාර්ථකත්වය බොහෝ දුරට රඳා පවතින්නේ ප්‍රජාවේ ක්‍රියාකාරී සහභාගිත්වය මතයි." ඔබ ඉහත ප්‍රකාශය සමඟ එකගද? පුනරුත්ථාපන ක්‍රියාවලියට පහසුකම් සැලසීමේදී ප්‍රජා නායකයින්, පවුල් සහ බාහිර ආයතනවල භූමිකාවන් සඳහන් කරමින් ඔබේ පිළිතුර සාධාරණීකරණය කරන්න. (ලකුණු 07)

(iii.) සෘණාත්මක ආකල්ප අවම කිරීමට සහ දුබලතා සහිත පුද්ගලයන් සඳහා සමාන අවස්ථා සහතික කිරීමට ප්‍රජා නායකයින්ට සහ සමාජිකයින්ට දායක විය හැක්කේ කෙසේද? අන්තර්කරණය ප්‍රවර්ධනය කිරීම සහ සමාජ පිළිගැනීම සඳහා සිදු කල හැකි ප්‍රජා ක්‍රියාකාරකම් තුනක් **(03)** සඳහා උදාහරණ සපයන්න. (ලකුණු 08)

11. (i.) ප්‍රජා මූලික පුනරුත්ථාපන වැඩසටහන්වල (CBR) ප්‍රධාන අංග සඳහන් කරන්න. (ලකුණු 05)

(ii.) CBR වැඩසටහන් තුළ දුබලතා සහිත පුද්ගලයන් සවිබල ගැන්වීමේදී පහසුකම් සැලසීම සහ ප්‍රාදේශීය ප්‍රජාවන් තුළ පුනරුත්ථාපනය සිදු කිරීමේ දී, සාර්ථකත්වය සහතික කිරීම සඳහා ප්‍රජා මූලික සේවකයන්ගේ කාර්යභාරය පැහැදිලි කරන්න. (ලකුණු 07)

(iii.) CBR හි බහුවිධ අංශයන්ට අයත් සේවා ප්‍රවේශයක වැදගත්කම සාකච්ඡා කරන්න. CBR වැඩසටහන් වල සාර්ථකත්වය සහතික කිරීම සඳහා විවිධ අංශ (සෞඛ්‍ය, අධ්‍යාපනය, රැකියා, ආදිය) සහයෝගයෙන් කටයුතු කරන්නේ කෙසේද? (ලකුණු 08)

12. (i.) එක්සත් ජනපදයේ සහ ශ්‍රී ලංකාවේ දුබලතා සහිත සිසුන්ට බලපාන ප්‍රධාන නීති සාකච්ඡා කරන්න. (ලකුණු 05)

(ii.) දුබලතා සහිත සිසුන් පුනරුත්ථාපනය කිරීමේදී පාසලේ භූමිකාව පැහැදිලි කරන්න. දුබලතා සහිත සිසුන් පාසලේ සිට පශ්චාත් පාසල් පරිසරයට සංක්‍රමණය වීමේදී ඔවුන්ට උපකාර කිරීමට පාසල් ඵලදායි ලෙස සහයෝගයෙන් කටයුතු කරන්නේ කෙසේද විස්තරකරන්න. (ලකුණු 07)

(iii.) දුබලතා සහිත දරුවන් පුනරුත්ථාපනය කිරීමේදී සාමාන්‍යය පන්තිකාමර ගුරුවරුන්ගේ කාර්යභාරය අගයන්න. (ලකුණු 08)

13. (i.) "මානව හිමිකම්" යන සංකල්පය පැහැදිලි කර දුබලතා සහිත පුද්ගලයන් සඳහා මෙම සංකල්පය අදාළ වන ආකාරය පැහැදිලි කරනන්. (ලකුණු 05)

(ii.) ප්‍රධාන අයිතිවාසිකම් තුනක් **(03)** ඉස්මතු කරමින් දුබලතා සහිත පුද්ගලයන්ගේ අයිතිවාසිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මුතියේ (UNCRPD) 2006 විධිවිධාන විශ්ලේෂණය කරන්න. (ලකුණු 07)

(iii.) UNCRPD (2006) 24 වැනි වගන්තියට අනුව ජීවිත කාලය පුරාම ඉගෙනීමේ දී (යාව ජීව අධ්‍යාපනය) රාජ්‍ය පාර්ශවයන් විසින් අන්තර්කරණ අධ්‍යාපනය සහතික කරන ක්‍රම පහක් **(05)** පැහැදිලි කරන්න. (ලකුණු 08)

14. (i.) 1973 පුනරුත්ථාපන පනතේ 504 වගන්තිය යටතේ සිසුන් සඳහා සේවා ලබා ගැනීමට ඇති සුදුසුකම් සහිත නිර්ණායක පැහැදිලි කරන්න. (ලකුණු 05)

(ii.) දුබලතා සහිත සිසුන්ට ඉඩසැලසීම සඳහා 504 වගන්තිය යටතේ පාසල්සතු වගකීම් සාකච්ඡා කරන්න. (ලකුණු 07)

(iii.) දුබලතා සහිත සිසුන් සඳහා 504 වගන්තියට අනුව එම ක්‍රියාවලිය තුළදී දෙමාපියන්ගේ කාර්යභාරය විශ්ලේෂණය කරන්න. (ලකුණු 08)

-සියලුම හිමිකම් ඇවිරිණි.-